# 06 ශ්‍රේණිය - ගණිතය

## ඒකක පුනරීක්ෂණ පොත

## (2020- නව නිර්දේශය)




**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**


**(කොළඹ නාලන්ද විද්‍යාලය මගින් එක් එක් ඒකකය සඳහා සියලූ ඒකක වලට නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 25ක් සහ අන්තර්ගතය.)**


# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය** NALANDA VIDYALAYA

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 1-වෘත්ත |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ඇඳ ඇති රූපය කුමක් ද?



2) ගෙදර දී සොයාගත් විවිධ වෘත්තාකාර ද්‍රව්‍ය ඇසුරෙන් වෘත්ත 5 ක් ඇඳ දක්වන්න.


3) කාසි භාවිතයෙන් කුඩාම වෘත්තයක් ඇඳිය හැකි කාසිය කුමක් ද?

විශාලම වෘත්තයක් ඇඳිය ඇඳිය හැකි කාසිය කුමක් ද?

4) චන්ද්‍රයා වෘත්තාකාරව පෙනෙන්නේ කවර දිනක දී ද?

5) ඔබට කැමති ප්‍රමාණයේ කාසියක් ගෙන පහත හිස්තැනෙහි වෘත්තයක් අඳින්න.
එම වෘත්තයේ ඇතුළත රතුපාටින් ද
පිටත නිල් පාටින් ද පාට කරන්න.

6) ඉහත ඇඳ ඇති රූපය බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





i) D රූපයේ ඇතුළත ලක්ෂ්‍යය මොනවා ද?


ii) පිටත ලක්ෂ්‍යය මොනවා ද?

iii) මත ලක්ෂ්‍යය මොනවා ද?

7) රූපයේ වෘත්ත කීයක් ඇඳ තිබේ ද?



8) පහත රූපයේ කුඩා වෘත්තය ඇතුලත A ලක්ෂ්‍යයත් විශාල වෘත්තය ඇතුළත B ලක්ෂ්‍යයත් ලකුණු කරන්න. වෘත්ත දෙකට ම පිටතින් C ලක්ෂ්‍යය ලකුණු කරන්න.



9) රුපියල් 5 කාසියක් භාවිතයෙන් වෘත්ත රටාවක් අඳින්න.

10) රු: 5.00 සහ රු: 2.00 භාවිතයෙන් වෘත්ත රටාවන් ඇඳ පෙන්වන්න.

*සැකසුම : නයනා අසෝකා මිය*

6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 2 - ස්ථානීය අගය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) මෙම සංඛ්‍යා ඉලක්කම් භාවිතයෙන් ලියන්න.

   i) නවසිය පනස් දෙදහස -

   ii) අටසිය දහස් පන්සිය පනහ -

   iii) තිස්පන් දහස් හාරසිය අට -

2) පහත දැක්වෙන සංඛ්‍යා ගණක, රාමුවල දක්වන්න.

   34 532　　80 008　　178 022

3) පහත සංඛ්‍යා සඳහා ව්‍යවහාරයේ පවතින වෙනත් නාම ලියන්න.

   සියක් දහස - 100 000 -

   ..................................................................

   මිලියනය - 1 000 000 -

   ..................................................................

   දස මිලියනය - 10 000 000 -

   ..................................................................

   සියක් මිලියනය- 100 000 000 -

   ..................................................................

4) සාමාන්‍ය ආකාරයට ඇති සංඛ්‍යා සම්මත ආකාරයට ලියන්න.

   285347 -

   107174165 -

5) $7645 = 7 \times 1000 + 6 \times 100 + 4 \times 10 + 5 \times 1$

ඉහත නිදසුනක් ආකාරයට පහත දැක්වෙන සංඛ්‍යා ස්ථානීය අගය ඇසුරෙන් විහිදුවා ලියන්න.

1) 2025 -

2) 10 6674 -

3) 465 -

4) 376001 -

6) පහත දැක්වෙන සංඛ්‍යා සම්මත ආකාරයට ලියා ඒවා කියවන ආකාරයට ද ලියන්න.

545001 -

34743215 -

308307305 -

7) 5, 8, 0, 3 ඉලක්කම් හතරම භාවිතයෙන් ලිවිය හැකි විශාලතම සංඛ්‍යාව හා කුඩාතම සංඛ්‍යාව ලියන්න.

8) පහත සඳහන් සංඛ්‍යා ඉලක්කමෙන් ලියන්න.

1) දෙමිලියන අටසිය හැට දෙක

2) විසි පන් දහස් එක

3) එක් මිලියන එකසිය දෙදහස

9) පහත සංඛ්‍යා කලාපවලට වෙන්කර ලියන්න.

1201338 -

35005407 -

215493200 -

10) ඉහත සංඛ්‍යා අකුරින් ලියන්න.

*සැකසුම : නයනා අසෝකා මිය*

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**6 ශ්‍රේණිය** | ගණිතය | ඒකකය: 3 -පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) සුළු කරන්න.

| i) | ii) | iii) |
|---|---|---|
| 1 6 2 | 2 0 2 5 | 1 7 6 6 |
| + 3 7 | + 3 6 9 7 | + 7 9 5 |

| iv) | v) | vi) |
|---|---|---|
| 2 6 3 | 3 9 7 5 | 2 9 7 0 |
| - 1 5 1 | - 2 3 4 1 | - 8 9 3 |

2) හිස්තැනට ගැලපෙන සංඛ්‍යා සොයන්න.

| i) | ii) | iii) |
|---|---|---|
| 5 8 | 3 6 7 | □□□ |
| + □□ | + □□□ | + 4 5 3 |
| 7 5 | 6 2 3 | 9 1 1 |

3) ගමක ජනගහනය 210 කි. ඉන් පාසල් ළමුන් 94 කි. ඉතිරි ගම් වැසියන් ගණන කීය ද?

4) භාණ්ඩ මිලදී ගැනීමේ දී ගත් භාණ්ඩවල වටිනාකම රු: 175 කි. ඒ සඳහා රු: 200/ කඩහිමියාට දුන් පසු ඉතිරි මුදල කීය ද?

5) ගුණ නොකොට අගය සොයන්න.

$43 \times 10 =$ $\qquad$ $32 \times 1000 =$

$75 \times 100 =$ $\qquad$ $372 \times 1000 =$

6) ගුණ කර පිළිතුර ලබා ගන්න.

684 × 5 = 972 × 25 = 412 × 32 =

7) පොල් ගෙඩියක මිල රුː 32.00 කි. ගෙඩි 12ක මිල කීය ද?

8) කම්කරුවෙකුගේ දිනක වැටුප රුː 1500.00 කි. එවැනි කම්කරුවන් 8ක් දිනක දී වැඩකළේ නම් ගෙවිය යුතු මුළු මුදල කීය ද?

9) බෙදන්න නැතුව පිළිතුර ලබා ගන්න.

90 ÷ 10 = 850 ÷ 10 = 500 ÷ 100 =

1700 ÷ 1000 = 250 ÷ 10 =

10) බෙදන්නේ නැතිව ලබ්ධිය හා ශේෂය ලියන්න.

35 ÷ 10 =

433 ÷ 10 =

250 ÷ 100 =

11) සුළු කරන්න.

54 ÷ 2 1008 ÷ 2 1410 ÷ 2

12) පහත සඳහන් සංඛ්‍යාවලින්

2න් ඉතිරිනැතුව බෙදෙන

5න් ඉතිරි නැතුව බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

84, 93, 636, 105, 98, 125, 65, 200, 73, 115, 68, 214, 145, 85, 132, 97

සැකසුම : නයනා අසෝකා මිය

6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 4 - කාලය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) දින 1 කට පැය කීය ද?

2) දිනකට ඔර්ලෝසුවේ පැය කටුව කී වාරයක් කරකැවේ ද?

3) පහත වේලාවන් අන්තර් ජාතික සම්මත ආකාරයට ලියන්න.

පෙ.ව. 7.45 = ....................    ප.ව. 11.05 = ....................

ප.ව. 3.50 = ....................    පෙ.ව. 10.25 = ....................

ප.ව. 2 යි මිනිත්තු 8 යි තත්පර 15 = ....................

4) පහත කාලයන් අසා ඇති ඒකකයෙන් දක්වන්න.

මිනිත්තු 2 = තත්පර ....................

මිනිත්තු 8 = තත්පර ....................

තත්පර 180 = මිනිත්තු ....................

මිනිත්තු 120 = පැය ....................

පැය 2 = මිනිත්තු ....................

මිනිත්තු 190 = පැය .................... මිනිත්තු ....................

5) පහත සංසිද්ධි සඳහා ගතවන කාලය සඳහන් කරන්න.

i) පෙ.ව. 8.40 ට ටෙලිනාට්‍යයක් ආරම්භ වී ප.ව. 9.05 ට අවසන් වීම.

ii) 21 : 30 ට රූපවාහිනී වැඩසටහන ආරම්භ වී 21 : 30 : 42 ට අවසන් වීම.

6) පහත සම්මත ආකාරයට ඇති වේලාවන් සාමාන්‍ය ඔර්ලෝසු වේලාවෙන් දක්වන්න.

i) 03 : 35 → ....................    ii) 09 : 40 → ....................

iii) 12 : 45 → ....................    iv) 18 : 30 → ....................

v) 21 : 35 → ....................    vi) 23 : 05 → ....................

7) එක් දිනක ආරම්භය ඊට පෙර දවසේ අවසානයයි. දිනක ආරම්භය හා දිනක අවසානය එකම මොහොතකය. එම වේලාවන් දෙකම සම්මත ආකාරයට ලියන්න.

8) සුළු කරන්න.

i)

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 4 | 48 |
| + | 3 | 32 |
| | | |

ii)

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 12 | 40 |
| - | 9 | 55 |
| | | |

iii)

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 8 | 21 |
| + | 3 | 20 |
| | | |

iv)

| | දින | පැය |
|---|---|---|
| | 5 | 12 |
| - | 3 | 21 |
| | | |

v)

| | මිනිත්තු | තත්පර |
|---|---|---|
| | 2 | 28 |
| + | 3 | 25 |
| | | |

vi)

| | මිනිත්තු | තත්පර |
|---|---|---|
| | 8 | 13 |
| - | 3 | 25 |
| | | |

9) නිවාසාන්තර මලල ක්‍රීඩා තරගයක දී 13 : 40 : 300 වයස 12න් පහළ මීටර් 100 ධාවන තරගය ආරම්භ විය. ජයග්‍රාහකයා තරගය අවසන් කළ වේලාව 13 : 40 : 55 ටය. ගතවූ කාලය ගණනය කරන්න.

10) i) ප.ව. 12.50 ට ආරම්භ වූ රැස්වීම අවසාන වූයේ ප.ව. 2.55 ට ය. ගතවූ කාලය ගණනය කරන්න.

ii) ඔබගේ උපන්දිනය සම්මත ආකාරයට ලියන්න.

iii) දින 1 = පැය ☐ = මිනිත්තු ☐ = තත්පර ☐

ඒ අනුව දින 5කට පැය කීයද?

*සැකසුම : නයනා අසෝකා මිය*


# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 5- **සංඛ්‍යා රේඛාව** |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) පහත සඳහන් ද්‍රව්‍යවල බර සංඛ්‍යා රේඛාවේ ලකුණු කරන්න.




A – මාගරින් පැකට්ටුවක බර 100 g B = පාන් කාලක බර 125 g


C – ජෑම් බෝතලයක බර 350 g D = තේකොළ පැකට්ටුවක බර 300 g

2) කමල්ගේ වයස - අවු. 10

ගීතාගේ වයස - අවු. 25

නිමල්ගේ වයස - අවු. 40

මෙම තොරතුරු පහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න. ඒ අනුව වයසින් වැඩිම තැනැත්තාත් වයසින් අඩුම තැනැත්තාත් නම් කරන්න.




3) ඉහත තිදෙනාගේ වයස අනුව > යොදා සැසඳීම් 3ක් ලියන්න.

4) වරහන තුළ දී ඇති සංඛ්‍යා අතුරින් හිස්තැනට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

i) ____ > 8 (3, 9, 8)

ii) ____ > 6 (2, 6, 7)

iii) 2 < _____ (0, 2, 5)

iv) _____ > 25 (1, 27, 23)

5) පහත අසමානතා වචනයෙන් ලියා දක්වන්න.


i) $6 > 2$ -

ii) $25 > 12$ -

iii) $0 < 5$ -

iv) $7 > 3$ -

6)




i) ඉහත සංඛ්‍යා රේඛාව මත 3, 5, 7 ලකුණු කර දක්වන්න.

ii) ඉහත සංඛ්‍යා රේඛාව මත ම -5, -3, -1 ලකුණු කර දක්වන්න.

iii) ඒ ඇසුරෙන් දී ඇති සංඛ්‍යා සඳහා $>$ හෝ $<$ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | ______ | 5 | -5 | _______ | 7 |
| 5 | ______ | 3 | 5 | _______ | -3 |
| -1 | ______ | -3 | 3 | _______ | -3 |
| -3 | ______ | -5 | 0 | _______ | 8 |

iv) ඉහත ලකුණු කරන ලද සංඛ්‍යා 6 ම ආරෝහණ පටිපාටියට ලියන්න.

v) ඉහත ඇඳ ඇති සංඛ්‍යා රේඛාවේ -5 හා +5 අතර ඇති

අ) ධන නිඛිල මොනවා ද?

ආ) ඍණ නිඛිල මොනවා ද?

vi) සංකේත මගින් ලියන්න.

අට දෙකට වඩා විශාල වේ. -

ඍණ තුන අටට වඩා කුඩා වේ. -

ඍණ පහ ඍණ දහයට වඩා විශාල වේ. -

*සැකසුම : නයනා අසෝකා මිය*

NALANDA V ... DA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA


# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**6** ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 6 - **නිමානය හා වැටයීම**


- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) විශාල සමචතුරස්‍රය කුඩා සමචතුරස්‍රය මෙන් කී ගුණයක් වේ ද?



2) ඔබේ පවුලේ වියදම් ගැන මව හා කථා කරන්න.
එක් මසකට වියදම් කරන මුදල කොපමණ වේදැයි නිමානය කරන්න. එම මුදල කුමන කාරණාවක් සඳහා දැයි දැක්වීමට ලැයිස්තුවක් පිළියෙල කරන්න.

3)




i) සංඛ්‍යා රේඛාව මත දක්වා ඇති P ට අදාල අගය කීයද?

ii) එය වඩා ආසන්න 10 ට ද? 20 ට ද?

iii) R ට අදාල අගය කීය ද?

iv) R ආසන්න 10 ට ද? 20 ට ද?

v) Q ට අදාල අගය කීය ද?

vi) Q ආසන්න 10 ට ද? 20 ට ද?

මෙහි දී ආසන්න අගය ගැනීමේ දී හරිමැද අගය නිසා ඉහලින් අගයට ආසන්න අගය ගැනීම කළ යුතුයි.

4) පහත සඳහන් සංඛ්‍යා ආසන්න 10ට වටයන්න.

| | | | |
|---|---|---|---|
| i) | 22 | vi) | 73 |
| ii) | 36 | vii) | 88 |
| iii) | 47 | viii) | 55 |
| iv) | 53 | ix) | 95 |
| v) | 69 | x) | 44 |

5) සංඛ්‍යාවක් ආසන්න 10ට වැටයූ විට පිළිතුර 60 විය. එම සංඛ්‍යාවට ගත හැකි සියලුම අගයන් ලියා දක්වන්න.

6) සංඛ්‍යාවක් ආසන්න 10 ට වැටයූ විට පිළිතුර 30 වේ. එම සංඛ්‍යාවට ගත හැකි අඩුම අගය සහ වැඩිම අගය ලියන්න.

7) හරි නම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද යොදන්න.

i) සංඛ්‍යා රේඛාවක දකුණු පසින් ඇති සංඛ්‍යාව වම්පසින් ඇති සංඛ්‍යාවට වඩා විශාල වේ. ( )

ii) -3 > 0 වේ. ( )

iii) 0 < 5 වේ. ( )

iv) 0ත් 5 අතර ඇති නිඛිල 1 2 3 4 වේ. ( )

v) -5 ත් +5 අතර ඇති නිඛිලයකි +6 ( )

සැකසුම : නයනා අසෝකා මිය

NALANDA V **නාලන්දා විද්‍යාලය - කොළඹ 10** DA VIDYALAYA


NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය** NALANDA VIDYALAYA

| | | |
|---|---|---|
| **6** ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 7 - **කෝණ** |

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.


1) ඔබ කැමති ආකාරයේ කෝණයක් ඇඳ දක්වන්න.

2) පහත රූපයේ ශීර්ෂය ඊ ද , බාහු ඊ හා ඊක ලෙස ද නම් කරන්න.




3) සෘජු කෝණයක රූප සටහනක් ඇඳ පෙන්වන්න.


4) පහත රූපය යටින් කෝණ වර්ගය ලියා දක්වන්න.




............................




............................



............................



............................



............................

5) ඔර්ලෝසු මුහුණතක පැය කටුව හා මිනිත්තු කටුව අතර සෘජුකෝණයක් දක්වන අවස්ථාවක් ඇඳ පෙන්වන්න.

6) අප අවට පරිසරය නිරීක්ෂණය කිරීමේ දී කෝණ දැකිය හැකි අවස්ථා 3ක් ලියන්න.

7) පහත ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

- වෘත්තාකාර හැඩය ඇති ද්‍රව්‍යයක් භාවිතයෙන් කඩදාසියක් මත වෘත්තයක් ඇඳ ගන්න.
- ඇඳ ගත් වෘත්තය කපා වෙන්කර ගන්න.
- වෘත්තාකාර ආස්තරය දෙකට නමන්න.
- දෙකට නැමූ ආස්තරය දිග නොහැර නැවත දෙකට නමන්න.
- දැන් දිග හැර නැමුම් දාර කෝදුව තබා තද පාටින් යා කරන්න.
- ඔබට ලැබුන කෝණ වර්ගය නම් කරන්න.

8) හරි නම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද යොදන්න.

i) සරල රේඛා ඛණ්ඩ 2ක් හමුවීමෙන් කෝණයක් සෑදේ. ( )

ii) සෘජු කෝණයට වඩා අඩු කෝණ මහා කෝණ වේ. ( )

iii) සෘජුකෝණ 2ක අගය සරල කෝණයක දැක්වේ. ( )

iv) සරල කෝණයට අඩු කෝණය පරාවර්ත කෝණ වේ. ( )

9) රූප අඳින්න.

සෘජු කෝණය මහා කෝණය සරල කෝණ පරාවර්ත කෝණ සුළු කෝණය

*සැකසුම : නයනා අසෝකා මිය*

**6 ශ්‍රේණිය** | ගණිතය | ඒකකය : 8 - **දිශා**


- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1* ප්‍රධාන දිශා කීයද?

2* එම දිශා සටහනකින් පෙන්වා දෙන්න.

3* උතුරු දිශාවේ සිට දක්ෂිණාවර්තව සෘජු කෝණයක් දක්වන දිශාව දිශා සටහනක් ඇසුරින් පෙන්වා දෙන්න.

4* පහත සඳහන් දිශා සහිත රූප සටහන් ඇඳ හිස්තැනට ගැලපෙන දිශාව හෝ අනු දිශාව ලියන්න.




5* උතුරු දිශාවේ සිට දක්ෂිණාවර්තව පරාවර්ත කෝණයක් සාදන දිශාවන් කිහිපයක් තිබේ. ඒ මොනවා ද? ඒවා සඳහා දළ සටහන් අඳින්න.

- තිරස් තල - සමතලා හා එක් පැත්තකට බැවුම් නොවන පරිද වූ තලයකි.

6* පාසලක දක්නට ලැබෙන තිරස් තල සඳහා උදාහරණ 3 ක් ලියන්න.

- සිරස් තල - තිරස් තලයකට ලම්බ වන පරිදි සකස් කෙරෙන තලයකි.

7* පාසලක දක්නට ලැබෙන සිරස් තල සඳහා උදාහරණ 3 ක් ලියන්න.

8* දිශාව බලා ගත හැකි උපකරණය කුමක් ද?

9* තලයක තිරස් ඔබ මනින උපකරණය කුමක්ද?

10* තලයක සිරස් බව මනින උපකරණය කුමක්ද?

සැකසුම : නයනා අසෝකා මිය

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA


## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | ගණිතය | **ඒකකය : 9 - භාග** |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.**

(1) පහත දක්වා ඇති භාග නිරූපණය කිරීම සඳහා දිග කොටු 5 ක් හා පළල කොටු 3ක් වන සේ සෘජුකෝණාස්‍ර ඇඳ රූපයට යටින් දී ඇති භාගය පාට කරන්න.

(i) (ii) (iii) (iv)



$\frac{1}{2}$ $\frac{1}{3}$ $\frac{2}{5}$ $\frac{3}{4}$

(2) i) $\frac{3}{5}$ හි හරය හා ලවය ලියන්න.

ii) හරය 7 සහ ලවය 4 වන භාගය ලියන්න.

(3) පහත දැක්වෙන එක් එක් භාගය සඳහා තුල්‍ය භාග දෙක බැගින් ලියන්න.

i) $\frac{2}{7}$ ii) $\frac{4}{5}$ iii) $\frac{8}{12}$ iv) $\frac{10}{15}$

(4) $<$, $>$ හෝ $=$ යන සංකේත සුදුසු පරිදි හිස්තැන් සඳහා යොදන්න.

i) $\frac{3}{7}$ ........ $\frac{5}{7}$ ii) $\frac{10}{15}$ ........ $\frac{6}{15}$ iii) $\frac{7}{9}$ ........ $\frac{5}{9}$

iv) $\frac{3}{4}$ ........ $\frac{6}{8}$ v) $\frac{4}{9}$ ........ $\frac{4}{5}$ vi) $\frac{7}{10}$ ........ $\frac{7}{12}$

vii) $\frac{2}{10}$ ........ $\frac{1}{5}$ viii) $\frac{7}{18}$ ........ $\frac{2}{3}$

(5) සුළු කරන්න.

i) $\frac{3}{5} + \frac{1}{5}$ ii) $\frac{4}{7} + \frac{2}{7}$ iii) $\frac{1}{4} + \frac{3}{4}$ iv) $\frac{1}{9} + \frac{2}{9} + \frac{3}{9}$

v) $\frac{9}{10} - \frac{3}{10}$ vi) $\frac{5}{8} - \frac{2}{8}$ vii) $\frac{10}{13} - \frac{4}{13}$ viii) $\frac{8}{15} + \frac{3}{15} - \frac{7}{15}$

ix) $\frac{1}{4} + \frac{3}{8}$ x) $\frac{2}{7} + \frac{10}{21}$ xi) $\frac{1}{2} + \frac{3}{16}$ xii) $\frac{11}{30} + \frac{1}{3}$

xiii) $\frac{19}{20} - \frac{2}{5}$ xiv) $\frac{4}{5} - \frac{4}{10}$ xv) $\frac{1}{2} - \frac{5}{12}$ xvi) $\frac{3}{4} - \frac{7}{12}$

(6) i) $\frac{1}{2}, \frac{1}{3}, \frac{5}{6}$ සහ $\frac{7}{12}$ යන භාග ආරෝහණ පටිපාටියට ලියන්න.

ii) $\frac{8}{15}, \frac{11}{15}, \frac{2}{3}$ සහ $\frac{3}{5}$ යන භාග අවරෝහණ පටිපාටියට ලියන්න.

සැකසුම: නයනා අසෝකා මිය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I කොටස

(1) 1 සිට 10 තෙක් සංඛ්‍යා ලියන්න.

(2) ඉහත පළමු ප්‍රශ්නයට ලියූ සංඛ්‍යාවන් ඔබ කැමති කාණ්ඩ දෙකකට වෙන් කරන්න.

(3) එම කාණ්ඩ දෙක සඳහා සුදුසු නම් ලියන්න.

(4) 60 සිට 100 තෙක් 6 ගුණාකාර ලියන්න.

(5) ඔබ ප්‍රදේශයේ ඇති ගස් වර්ග 12 ක් හඳුනාගෙන ඒවායේ නම් ලියන්න.

(6) ඔබ කැමති පරිදි ඒවා කාණ්ඩ දෙකකට හෝ තුනකට වෙන් කරන්න.

(7) එම කාණ්ඩ සඳහා සුදුසු නම් ලියන්න.

(8) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක තුන නම් කරන්න.


(9) සාධක 2ක් පමණක් ඇති සංඛ්‍යා හඳුන්වන නාමය ලියන්න.

(10) සාධක 2ක් පමණක් ඇති සංඛ්‍යා 5ක් ලියන්න.

## II කොටස

(1) පහත සමූහය තුළ ඇති සංඛ්‍යා කාණ්ඩ තුනකට වෙන් කර ඒ ඒ කාණ්ඩය සඳහා සුදුසු නමක් බැගින් ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 0.5 | 6 | 2 | 0.6 | $\frac{4}{7}$ | 1.7 |
| 8 | 3.2 | $\frac{2}{3}$ | 3 | $\frac{1}{6}$ | $\frac{7}{8}$ |



…………………… ……………………… ……………………..

(2) $1 - 50$ අතර ඇති 10 ගුණාකාර සහ 7 ගුණාකාර කාණ්ඩ දෙකකට වෙන් කර දක්වන්න.

(3) කෝණ සහ හැඩතල යන කාණ්ඩ දෙකට අදාලව රූප සටහන් භාවිතා කර වෙන් කරන්න.

(4) දී ඇති සියලු සංඛ්‍යා කාණ්ඩ 2කට වෙන් කර එම කාණ්ඩ සුදුසු ලෙස නම් කරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | 19 | 11 | 17 | 1 | 4 | 15 |
| 8 | 18 | 7 | 24 | 10 | 5 | 6 |

(5) පහත දක්වෙන දෑ සුදුසු පරිදි කාණ්ඩ දෙකකට වෙන් කර එම කාණ්ඩ නම් කරන්න.

| | | |
|---|---|---|
| සිංහල | අක්කා | විද්‍යාව |
| තාත්තා | ඉංග්‍රීසි | අම්මා |
| ගණිතය | | මල්ලී |

*සැකසුම : නයනා අසෝකා මිය*

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

(1) 18 පූර්ණ සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලියන්න.

(2) 7 හි මුල් ගුණාකාර දෙක ලියන්න.

(3) 20 ට වැඩි 3 හි ගුණාකාර 2 ක් ලියන්න.

(4) 10 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක් හඳුනා ගන්නේ කෙසේද?

(5) 202 ☐ , මෙය 5 හි ගුණාකාරයකි. හිස් කොටුවට ගැලපෙන ඉලක්කම් ලියන්න.

(6) 30 ට අඩු හයේ ගුණාකාර 2 ක් ලියන්න.

(7) පහත සංඛ්‍යා අතරින් සාධක 2 ක් පමණක් ඇති සංඛ්‍යාව කුමක් ද?

31, 48, 27, 51, 39

(8) 3 සහ 5 යන සංඛ්‍යා දෙකෙහි ම ගුණාකාර වන සංඛ්‍යා 2 ක් ලියන්න.

(9) 2 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා තෝරන්න.

527, 2 644, 43 016, 12 485

(10) 5 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක් හඳුනා ගන්නේ කෙසේද?

## II කොටස

(1) පහත දැක්වෙන සංඛ්‍යාවල සාධක ලියන්න.

1) 20 2) 9 3) 45 4) 60

(2) බෙදීමේ ක්‍රමයෙන් 72 හි සියලුම සාධක ලියන්න.

(3) 1 ත් 50 ත් අතර ඇති, 1) 10 හි ගුණාකර මොනවා ද?

2) 3 හි ගුණාකර මොනවා ද?

(4) 60 කුමන සංඛ්‍යාවල ගුණාකාරයක් වේද?

(5) 1) 9 යන සංඛ්‍යාව 45 හි සාධකයක් වේ.

2) 7 යන සංඛ්‍යාව 45 හි සාධකයක් නොවේ.

ඉහත කරුණු දෙක සනාථ කරන්න.

(6) 2 හි නව වන ගුණාකාරය 3 හි කීවන ගුණාකාරය ද?

(7) බත් පිළියෙල කිරීම සඳහා එක් දිනකට එක් අයෙකුට සහල් 400 g ක් අවශ්‍ය වේ.

1) සතියකට අවශ්‍ය සහල් ප්‍රමාණය කොපමණ ද? (එක් අයෙකුට)

2) එක් අයෙකුට මසකට අවශ්‍ය සහල් ප්‍රමාණය කොපමණ ද?

(8) හිස්තැන් පුරවන්න.

$88 = 11 \times 8$

1) 88 සංඛ්‍යාව ................................ හි ගුණාකාරයකි.

2) 88 සංඛ්‍යාව ................................ හි ගුණාකාරයකි.

(9) 32 සංඛ්‍යාව සංඛ්‍යා දෙකක ගුණිතයක් පරිදි ලිවිය හැකි සෑම ආකාරයකටම ලියා දක්වන්න.

(10) 150 ට අඩු 12 හි විශාලතම ගුණාකාරය කුමක් ද?

(11) පාසලේ පහසුකම් හා සේවා ගාස්තු වශයෙන් වසරකට රු. 800 බැගින් අය කරයි. පහත සඳහන් පංති වලින් ලැබුණු ආදායම සෙවීම සඳහා වගුව සම්පූර්ණ කරන්න.

| පන්තිය | 6A | 6B | 6C | 6D | 6E |
|---|---|---|---|---|---|
| සිසුන් ගණන | 38 | 40 | 32 | 36 | 41 |
| ගාස්තු ප්‍රමාණය | .......... | .......... | .......... | .......... | .......... |

මෙම පන්තිවලින් ලැබුණු ආදායම කොපමණ ද?

*සැකසුම: වසන්ත වඩුගේ මයා*

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය


**6 ශ්‍රේණිය** | ගණිතය | **ඒකකය**: 12 - **සරල රේඛීය තල රූප**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.**

(1) සරල රේඛා ඛණ්ඩයක් අඳින්න.


(2) වක්‍ර රේඛා ඛණ්ඩයක් අඳින්න.

(3) සංවෘත තල රූප යටින් ඉරක් අඳින්න.



i) ii) iii) iv)

(4) සරල රේඛීය තල රූප යටින් ඉරක් අඳින්න.




i) ii) iii) iv) v)


(5) සරල රේඛීය තල රූපයක අංග මොනවාද?

(6) i) චතුරස්‍ර වර්ග කීය ද?
ii) ඒ මොනවාද?
iii) ඒ එක එකෙහි ලක්ෂණ මොනවා ද?

(7) පහත දී ඇති චතුරස්‍ර හඳුන්වන නම් ලියන්න.



…………………… …………………… ……………………



……………………… ………………………

*සැකසුම : නයනා අසෝකා මිය*

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**I කොටස**

(1) පහත දශම සංඛ්‍යා කියවන ආකාරය ලියන්න.


i) 0.28 ii) 56.5

(2) පහත භාග දශමවලින් ලියන්න.


i) $\frac{7}{10}$ ii) $\frac{38}{100}$

(3) පහත සඳහන් ගණක රාමුවලින් දැක්වෙන අගයන් ලියන්න.

i)




ii)




(4) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සකස් කරන්න.

i) 0.7, 0.69, 0.93, 0.78

ii) 12.59, 20.07, 12.95, 20.75

(5) පහත දී ඇති සංඛ්‍යා යුගල =, <, > සංකේත යොදමින් සම්බන්ධ කරන්න.

i) 0.7 ………………. 0.9

ii) 0.8 ………………. 0.80

iii) 0.08 ………………. 0.06

iv) 1.8 ………………. 2.6

## **II** කොටස

(1) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ඉලක්කම | එම ඉලක්කම පිහිටන ස්ථානයේ නම | එම ඉලක්කමෙන් නිරූපණය වන අගය |
|---|---|---|---|
| 1.75 | 7 | | |
| 82.34 | 2 | | |
| 7.86 | 6 | | |
| 57.0 | 5 | | |
| 9.03 | 0 | | |

(2) එකතු කරන්න

i) 0.8 + 0.3

ii) 0.72 + 0.23

iii) 5.32 + 1.84

iv) 3.25 + 6.98

v) සිසිර ගමනකින් 1.8 *km* ක් බයිසිකලයෙන් ගමන් කර ඉතිරි 0.78 *km* පයින් ගොස් ගමන නිම කළේය. ඔහු ගමන් කළ මුළු දුර කොපමණ ද?

(3) අඩු කරන්න

i) 0.9 - 0.5

ii) 3.7 - 2.9

iii) 9.67 - 2.41

iv) 15.06 - 0.73

v) මවක විසින් සිය පුතුන් දෙදෙනා වන වරුණ හා අමර වෙත සිය ඉඩමෙන් 0.65 ක ප්‍රමාණයක් පවරා දුන්නේය. වරුණට ලැබුණු ප්‍රමාණය ඉඩමෙන් 0.37 ක් නම්, අමරට ලැබුණු ප්‍රමාණය ඉඩමෙන් කොපමණ ප්‍රමාණයක් ද?

*සැකසුම: වසන්ත වඩුගේ මයා*

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 6- සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා |
|---|---|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

## I කොටස

(1) කුඩාම ප්‍රථමක සංඛ්‍යාව කුමක් ද?

(2) සංයුක්ත සංඛ්‍යා යනු මොනවා ද?

(3) ඉරට්ටේ සංඛ්‍යාවක් වන ප්‍රථමක සංඛ්‍යාව කුමක් ද?

(4) 1 ප්‍රථමක සංඛ්‍යාවක් වේද? නොවේද? හේතු දක්වන්න.

(5) 12 වන වර්ග සංඛ්‍යාව ලියන්න.

(6) වර්ග සංඛ්‍යා 2 ක එකතුය 34 වේ නම් එම සංඛ්‍යා දෙක සොයන්න.

(7) ප්‍රථමක සංඛ්‍යාවක් වන ත්‍රිකෝණ සංඛ්‍යාව කුමක් ද?

(8) 6 වන ත්‍රිකෝණ සංඛ්‍යාව සොයන්න.

(9) අනුයාත සංයුක්ත සංඛ්‍යා යුගලයක් ලියන්න.

(10) 12, ප්‍රථමක සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලියන්න.

## II කොටස

(1) ගණනය කිරීමකින් තොරව ප්‍රතිඵලය ඔත්තේ ද ඉරට්ටේ ද යන්න ලියා දක්වන්න.

1) 12 + 18 ..........................................

2) 79 – 33 ..........................................

3) 40 – 15 ..........................................

4) 54 × 16 ..........................................

5) 3 × 9 ..........................................

(2) 1) 10 ට වැඩි 25 ට අඩු ඔත්තේ සංඛ්‍යා ලියන්න.

2) පහත සඳහන් සංඛ්‍යා වලින් ඉරට්ට සංඛ්‍යා රවුම් කර ඔත්තේ සංඛ්‍යා කොටු කරන්න.

254   193   452   277   381   578

3) 0, 3, 8, 7 යන ඉලක්කම් භාවිතයෙන් ඉලක්කම් 4 කින් යුත්,

a) ඉරට්ට සංඛ්‍යා 3 ක් ලියන්න.

b) ඔත්තේ සංඛ්‍යා 3 ක් ලියන්න.

(3) 1) සමචතුරස්‍ර සංඛ්‍යා යනු මොනවා ද?

2) 20 ට අඩු සමචතුරස්‍ර සංඛ්‍යා ලියන්න.

3) 20 ත් 30 ත් අතර පිහිටි සංයුක්ත සංඛ්‍යා ලියන්න.

4) අනුයාත ත්‍රිකෝණ සංඛ්‍යා 2 ක එකතුව වර්ග සංඛ්‍යාවක් වේ. මෙය සනාථ කිරීමට උදාහරණයක් ලියා දක්වන්න.

*සැකසුම: වසන්ත වඩුගේ මයා*

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**6 ශ්‍රේණිය** | ගණිතය | ඒකකය: 15 - දිග

### I – කොටස

(1) දිග මැනීමට භාවිතා කරන උපකරණ 2 ක නම් ලියන්න.

(2) 6 cm ක් දිග සරල රේඛා ඛණ්ඩයක් අඳින්න.

(3) කිලෝමීටරයකට ඇති මීටර ගණන කොපමණ ද?

(4) දොරක උස ................................. වඩා තරමක් වැඩි විය යුතුය.

(5) උස යොදා ගනිමින් තොරතුරු දක්වන අවස්ථා සඳහා නිදසුන් 2 ක් ලියන්න.

(6) මීටරයකට ඇති සෙන්ටිමීටර ගණන කීය ද?

(7) රුපියල් පහේ කාසියක ඝනකම මැන ලියන්න.

(8) පහත රේඛා ඛණ්ඩයේ දිග මැන ලියන්න.

A ———————————————— B

(9) එකතු කරන්න.

| | m | cm |
|---|---|---|
| + | 8 | 75 |
| | 3 | 35 |
| | | |

(10) අඩු කරන්න.

| | km | m |
|---|---|---|
| + | 7 | 790 |
| | 4 | 860 |
| | | |

## II – කොටස

(1) පහත එක් එක් අවස්ථාවේ සඳහන් දිග මැනීමට සුදුසු ඒකකය ඉදිරිපස ඇති කොටුවෙන් තෝරා ලියන්න.

| | |
|---|---|
| මිලි | (mm) |
| සෙන්ටිමීටර | (cm) |
| මීටර | (m) |
| කිලෝමීටර | (km) |

i) බෙහෙත් පෙත්තක දිග

ii) ළිඳක ගැඹුර

iii) කොළඹ සිට නුවරට දුර

iv) පැන්සලක දිග

v) අල්මාරියක උස

(2) හිස්තැන් පුරවන්න.

i) 7cm = ………………………mm

ii) 500cm = ………………………m


iii) 2000m = ………………………km

iv) 8cm = ………………………cm


v) 15mm = ………………………cm

(3) පහත රූපවල පරිමිතිය සොයන්න.


i)




ii)




iii)




*සැකසුම : වසන්ත වඩුගේ මයා*

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 16 - ද්‍රව මිනුම් |
|---|---|---|

## I කොටස

(1) ද්‍රව ප්‍රමාණ මැනීම සඳහා භාවිත වන ඒකක දෙකක් සඳහන් කරන්න.

(2) මිලිලීටර 1000 ක් ලීටර කීය ද?

(3) මිලිලීටර වලින් ද්‍රව මනින අවස්ථා සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(4) ලීටර වලින් ද්‍රව මනින අවස්ථා සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(5) බෝතලයකට අල්ලන ද්‍රව ප්‍රමාණය මිලිලීටර කොපමණ ද?

හිස්තැන් පුරවන්න.

| | ලීටර | ලීටර හා මිලිලීටර | මිලිලීටර |
|---|---|---|---|
| (6) | $2\frac{1}{4}\ l$ | ........................... | ........................... |
| (7) | 1.5 *l* | ........................... | ........................... |
| (8) | ........................... | ........................... | ........................... |
| (9) | ........................... | 3*l* 700 *ml* | ........................... |
| (10) | ........................... | 5*l* 250 *ml* | 6575 *ml* |

## II කොටස

(1) පහත දී ඇති ද්‍රව ප්‍රමාණ දැක්වීමට වඩාත්ම සුදුසු ඒකකය ලීටර ද මිලිලීටර ද යන්න සඳහන් කරන්න.

1) අත්ලට අල්ලන ද්‍රව ප්‍රමාණය ..............................................................
2) වතුර ටැංකියකට අල්ලන ද්‍රව ප්‍රමාණය ..............................................................
3) රාත්‍රී ආහාරයෙන් පසු බීමට ගන්නා ජල ප්‍රමාණය ..............................................................
4) නෑමට අවශ්‍ය වන ජල ප්‍රමාණය ..............................................................
5) බෙහෙත් සිරිංජයකට අල්ලන ද්‍රව ප්‍රමාණය ..............................................................

(2) සුළු කරන්න.

i) ml

350
+ 270


ii) ml

809
+ 350

iii) l ml

5 625
+ 2 750

iv) ආ) භාජන දෙකෙහි ම ඇති ද්‍රව ප්‍රමාණය ml කොපමණ ද?




ආ) ඉහත 1 හි පිළිතුරු ලීටරවලට හරවා දක්වන්න.

(3) සුළු කරන්න.

i) ml

580
- 265


ii) ml

3 250
- 2 750

iii) l ml

14 109
- 6 250

iv)




ආ) විශාල භාජනයේ ඇති ද්‍රව ප්‍රමාණයෙන් කුඩා භාජන දෙක පිරවූ විට විශාල භාජනයේ ඉතිරිවන ද්‍රව ප්‍රමාණය කොපමණ ද?

*සැකසුම : වසන්ත වඩුගේ මයා*

## I කොටස

(1) ඝනකයක හැඩය ඇති ඝන වස්තු දෙකක් ලියන්න.

(2) ඝනකයක ඇති දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න.

(3) පරිසරයේ දක්නට ලැබෙන ඝනකාභ හැඩය ඇති ඝන වස්තු 2 ක් නම් කරන්න.

(4) ඝනකාභයක ඇති මුහුණත් ගණන කොපමණ ද?

(5) ඝන වස්තු ලෙස හැඳින්වෙන්නේ කුමක් ද?

(6) චතුස්තලයක ඇති දාර ගණන හා මුහුණත් ගණන ලියන්න.

- පහත එක් එක් සරල රේඛීය තල රූපයේ හැඩය මුහුණත් ලෙස දැකිය හැකි ඝනවස්තුවක් බැගින් ලියා දක්වන්න.

(7) ඍජුකෝණාස්‍රය

(8) සමචතුරස්‍රය


(9) ත්‍රිකෝණය

(10) ත්‍රිපිරමිඩයක දැකිය හැකි ලක්ෂණයක් ලියන්න.

## <u>II කොටස</u>

(1) 1) දාරයක දිග 4cm වන ඝනකයක් සෑදීම සඳහා සුදුසු පතරමක් අඳින්න.

2) රූපයේ දැක්වෙන ඝනකය තවත් එවැනි ම ඝනකයක් මත මුහුණත් 2 ක් එක මත එක තබා ඇලවීමෙන් ඝන වස්තුවක් සාදා ගනු ලැබේ.




අ) සාදා ගන්නා ඝන වස්තුව කුමන ආකාරයේ එකක් ද?


ආ) එම ඝන වස්තුවේ මිනුම් ලියන්න.

(2) 1) ඝනකාභ හැඩය ඇති පෙට්ටියක් තැනීමට අවශ්‍ය පතරමක් අඳින්න.


2) ඝනකාභයක ඇති දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න.

3) රූපයේ දැක්වෙන පතරම භාවිතයෙන් සාදා ගන්නා ඝනකාභයේ දිග, පළල හා උස මැන ලියන්න.

4) ඝනකාභයක ලක්ෂණ 2 ක් ලියන්න.




(3) i) සවිධි චතුස්තලයක පතරමක් රූපයේ දැක්වේ.




a) එහි මුහුණතක හැඩය කුමක් ද?

b) මෙම පතරමට අනුව චතුස්තලයේ දාරයක දිග කොපමණ ද?

ii) එකිනෙකට සමාන සවිධි චතුස්තල දෙකක මුහුණත් 2 ක් එක මත එක වන පරිදි තබා ඇලවීමෙන් ඝන වස්තුවක් තනා ඇත. එම ඝන වස්තුවේ,

a) මුහුණත් ගණන

b) දාර ගණන

c) ශීර්ෂ ගණන ලියන්න.

ii) දාරයක දිග 6 cm වන සවිධි චතුස්තලයක ආකෘතියක් සෑදීම සඳහා සුදුසු පතරමක් අඳින්න.

*සැකසුම : නේෂා නිවන්ති මිය*

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 18- වීජීය සංකේත |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

## I කොටස

(1) පහත ප්‍රකාශනවල ඥාත නියත වන ප්‍රකාශන මොනවා ද?

1) සතියකට ඇති දින ගණන
2) පොත් බෑගයක ඇති පොත් ගණන
3) ඔබ උගත් වචන ගණන
4) පැයකට ඇති මිනිත්තු ගණන

(2) එල්ලේ කණ්ඩායමක සිටින ක්‍රීඩකයින් ගණන ඥාතයක් වේ / නොවේ.
නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(3) ඔබ දන්නා ගණිත කර්ම 4 ලියන්න.

(4) සමචතුරස්‍රයක ඇති පාද ගණන වීජීය සංකේතයකින් දැක්විය හැකිය. එය නියතයක් ද? විචල්‍යයක් ද?

(5) වීජීය සංකේත යොදා පහත වාක්‍ය ගොඩ නගන්න.

1) පොල් ගසකින් කඩන ලද පොල් ගෙඩි ගණන.
2) පොත් බෑගයක මිල
3) පිට්ටනිය වටේ දිග
4) පන්තියක සිටින සිසුන් ගණන
5) රූපවාහිනී යන්ත්‍රයක මිල
6) බස් රථයක ගමන් ගන්නා මගීන් ගණන.

## II කොටස

(1) ඔබ දන්නා නියත ප්‍රකාශන 5 ක් ලියන්න.

(2) ඔබ දන්නා විචල්‍යයන් දැක්වෙන ප්‍රකාශන 5 ක් ලියන්න.

(3) විචල්‍යයන් සහ නියතයන් වෙන් කරන්න.

1) දිනක වර්ෂාපතනය
2) සමචතුරස්‍රයක ඇති සෘජුකෝණ ගණන
3) සතියකට ඇති දින ගණන
4) පිට්ටනියක වටේ දිග
5) පොතක දී ඇති පිටුවක වචන ගණන
6) වොලිබෝල් කණ්ඩායමක සිටින ක්‍රීඩකයන් ගණන
7) දේදුන්නේ පාට ගණන
8) පැයකට ඇති මිනිත්තු ගණන
9) කෑම මේසයක පළල
10) පොල් ගෙඩියක මිල

*සැකසුම: නයනා අසෝකා මිය*

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 19 |
|---|---|---|

## වීජීය ප්‍රකාශන ගොඩනැගීම හා ආදේශය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

### I කොටස

(1) ඉලක්කම් හා සංකේත භාවිත කර ලියන්න.

1) 5 ට 7 ක් එකතු කිරීම.

2) 9 න් 4 ක් අඩු කිරීම.

(2) වචනයෙන් ලියන්න.

1) $7 - 2$

2) $6 + 3$

(3) සංකේත භාවිතයෙන් ලියන්න.

8 ට 2 ක් එකතු කල විට 10 ලැබේ.

(4) හිස් කොටුවට අදාල සංඛ්‍යාව ලියන්න.

1) $3 + \square = 10$

2) $\square - 8 = 3$

(5) $x = 8$ විට, $x + 3$ හි අගය කියද?

(6) $y = 12$ විට, $y - 5$ හි අගය කියද?

(7) පළමු පදය $y$ දෙවන පදය 7 වේ.

1) පළමු පදය හා දෙවන පදය එකතු කරන්න.

2) පළමු පදයෙන් දෙවන පදය අඩු කරන්න.

ඉහත 1) 2) ප්‍රකාශන ලියන්න.

(8) ඔබ දන්නා සංකේත පහක් ඇඳ පෙන්වන්න.

(9) $a + 15$ මෙම ප්‍රකාශනයට වගන්තිය ලියන්න.

(10) වීජීය සංකේත 5 ක් ලියන්න.

## II කොටස

(1) පහත වගන්ති සඳහා ප්‍රකාශන ලියන්න.

1) අටෙන් තුනක් අඩුකර දෙකක් එකතු කරන්න.
2) මා ළඟ රු. x ඇත. එයින් රු. 8 ක් මල්ලීට දුනිමි. ඉතිරි මුදල
3) සංඛ්‍යා දෙකක එකතුව 18 වේ. ඉන් එක් සංඛ්‍යාවක් y නම් අනෙක් සංඛ්‍යාවට වීජීය ප්‍රකාශනය ලියන්න.
4) පන්තියක ළමුන් x ඇත. අනෙක් පංතියේ 23 දෙනෙකි. පංති දෙකේම ළමුන් ගණන
5) y යනු සංඛ්‍යාවකි. y ට වඩා 12 කින් වැඩි සංඛ්‍යාව.

(2) $x = 12$ වන විට,

1) $x + 5$ 2) $x + 4$ 3) $x - 6$ 4) $2x$
5) $20 - x$

එක් එක් වීජීය ප්‍රකාශනයේ අගය සොයන්න.

(3) + ලකුණ හෝ – ලකුණ හෝ අදාල සංඛ්‍යාව යොදා වගුව සම්පූර්ණ කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 3 | | 8 | → | 11 |
| | ■ | | ■ | ■ |
| | + | | → | 6 |
| ↓ | ■ | | ■ | ■ |
| 2 | | | → | 5 |

*සැකසුම: නයනා අසෝකා මිය*

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.**

(1) 3605 g, kg වලින් ලියන්න.

(2) 1.25 kg, g වලින් ලියන්න.

(3) 1 kg 775 g, kg වලින් ලියන්න.

(4) 2.5 kg, kg වලින් හා g වලින් ලියන්න.

(5) 750 g, මෙය kg වලින් ලියන්න.

(6) හිස්තැන් පුරවන්න.

100 g $= \frac{1}{10}$ kg = 0.1 kg

200 g = ……. kg = ……. kg

500 g = ……. kg = ……. kg

(7) 1 kg ට 500g ඒවා කීය ද?

(8) 1 kg = ………… g × 4 = 500 g × ………… = ………… g × 8 = 100 g × ………… හිස්තැන් සම්පූර්ණ කරන්න.

(9) 6075 g = ………… kg ………… g = ………… kg හිස්තැන් පුරවන්න.

(10) 10 050 g = ………… kg ………… g සම්පූර්ණ කරන්න.

## <u>II කොටස</u>

(1) i) 575 g + 350 g සුළු කරන්න.

ii) 3 kg 750 g + 2 kg 650 g සුළු කරන්න.

iii) 5 kg – 2 kg 675 g සුළු කරන්න.

iv) 5.75 kg – 3.657 kg සුළු කරන්න.

iv) ……….. g $= \frac{1}{1000}$ kg = 0.001 ……….. ගැලපෙන සේ හිස්තැන් පුරවන්න.

## මිල දර්ශනය

(2)

| | | |
|---|---|---|
| කිරි පිටි | 100 g | රු. 54. 00 |
| සබන් කැට | 1 | රු. 65. 00 |
| මාගරින් පැකට් | 1 | රු. 105.00 |
| තේ කුඩු | 100 g | රු. 60. 00 |

පහත ද්‍රව්‍ය ලැයිස්තුවට යන මුළු වියදම ගණනය කරන්න.

| | |
|---|---|
| කිරි පිටි | 1 kg |
| සබන් කැට | 2 |
| මාගරින් පැ. | 1 |
| තේ කුඩු | 90 g |

(3) සුළු කරන්න.

1)

| kg | g |
|---|---|
| 2 | 805 |
| + 3 | 745 |
| | |

2)

| kg | g |
|---|---|
| 4 | 250 |
| + 3 | 765 |
| | |

3)

| kg | g |
|---|---|
| 4 | 265 |
| – 1 | 780 |
| | |

4)

| kg | g |
|---|---|
| 13 | 875 |
| – 6 | 992 |
| | |

5) 4 kg 60 g + 7 kg 997 g = ………………. kg ………………. g

*සැකසුම: නයනා අසෝකා මිය*

**6 ශ්‍රේණිය** | ගණිතය | **ඒකකය : 21 - අනුපාත**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) පහත අනුපාත වගන්ති වලින් ලියන්න.

i) 1 : 5 ii) 5 : 9

(2) තුනට එක අනුපාතය සංකේත ඇසුරින් ලියන්න.

(3) කාමරයක දිග 12 m ද පළල 7 m ද වේ. කාමරයේ පළල හා දිග අතර අනුපාතය ලියන්න.

(4) 12 : 7 පද මොනවා ද?

(5) තුල්‍ය අනුපාත 2 ක් ලියන්න.

4 : 7

(6) 15 : 9 සරලම අනුපාතය ලියන්න.

(7) සත 25 සහ රුපියල අතර අනුපාතය ලියන්න.

(8) ආහාර මිශ්‍රණයක පිටි 500 g ද සීනි 1 kg ද තිබේ. එම මිශ්‍රණයේ පිටි හා සීනි අතර අනුපාතය ලියන්න.

(9) පොත් 3 ක මිල රු. 18 වේ. පොත් 6 ක මිල කීය ද?

(10) 300 g හා $1\frac{1}{2}$ kg අතර අනුපාතය සරලම ආකාරයට ලියන්න.

## II කොටස

(1) මගේ ගෙදර සිට පාසලට දුර කි. මී. 1 යි මීටර් 250 කි. මාලාගේ නිවසේ සිට පාසලට දුර කිලෝමීටර් $\frac{1}{2}$ කි. මගේ ගෙදර සිට පාසලට හා මාලා ගේ නිවසේ සිට පාසලට දුර අතර අනුපාතය සරලම ආකාරයට ලියන්න.

(2) බිත්තර 5 ක මිල රු. 105 ක් වේ. බිත්තර 8 ක මිල සොයන්න.

(3) අනුපාත වන වගන්ති තෝරන්න.

1) මගේ බර තාත්තාගේ බරෙන් $\frac{1}{2}$ කි.
2) මගේ නිවසට දුර පාසලට ඇති දුරට වඩා අඩුය.
3) මල්ලීගේ වයස නංගීගේ වයසට වැඩිය.
4) ආහාරයකට පිටි 500 g ට සීනි 250 g ක් අවශ්‍යයි.
5) නිල් කොඩි 3 කට කහ කොඩි 1 ක් තිබේ.

(4) පහත අනුපාත සඳහා තුල්‍ය අනුපාත ලියන්න.

i) 8 : 4 ii) 15 : 9

(5) සරලම ආකාරයෙන් ලියන්න.

i) 56 : 21 ii) 60 : 150

*සැකසුම: නයනා අසෝකා මිය*

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) පැයක් ඇතුළත පාරක ගමන් කරන ලද වාහන පිළිබඳ දත්ත පහත දැක්වේ.

| වාහනය | ප්‍රගණනය | සංඛ්‍යාව |
|---|---|---|
| වෑන් | 𝍸 /// | 8 |
| ලොරි | /// | .......... |
| කාර් | 𝍸 𝍸 /// | .......... |
| බස් | ........................................... | 13 |
| බයිසිකල් | ........................................... | 5 |
| වෙනත් | 𝍸 /// | ......... |

1) වගුව පිටපත් කරගන්න. හිස්තැන් සම්පූර්ණ කරන්න.

2) වැඩිම වාහන වර්ගය කුමක් ද?

3) අඩුම වාහන වර්ගය කුමක් ද?

4) එම කාලසීමාවේදී ගමන් කල මුළු වාහන ගණන සොයන්න.

(2) සතියේ දින 5ක 6 වසර සිසු පැමිණීම පහත පරිදි වේ. එක් සංකේතයකින් දෙදෙනෙකු නිරූපණය වන පරිදි එම දත්ත සඳහා චිත්‍ර ප්‍රස්තාරයක් අඳින්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| සඳුදා | 36 | බදාදා | 44 | සිකුරාදා | 28 |
| අඟහරුවාදා | 40 | බ්‍රහස්පතින්දා | 32 | | |

(3) ළමයි 40 දෙනෙකුගෙන් විමසා බලා ඔවුන්ගේ සපත්තුවල දිග පිළිබඳ ලබාගත් දත්ත පහත දැක්වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20 | 21 | 20 | 21 | 22 | 23 | 20 | 24 | 23 | 21 |
| 21 | 20 | 21 | 24 | 21 | 21 | 25 | 21 | 23 | 23 |
| 22 | 21 | 23 | 25 | 22 | 24 | 21 | 22 | 22 | 21 |
| 21 | 21 | 22 | 24 | 20 | 21 | 24 | 21 | 21 | 24 |

පහත දැක්වෙන වගුවේ ඉහත දත්ත ඇතුළත් කරන්න.

| සපත්තුවක දිග (cm) | ප්‍රගණනය | සංඛ්‍යාව |
|---|---|---|
| 20 | | |
| 21 | | |
| 22 | | |
| 23 | | |
| 24 | | |
| 25 | | |

(4) පහත දත්ත චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න.

| පළතුරු | සංඛ්‍යාව |
|---|---|
| අන්නාසි | 80 |
| අඹ | 75 |
| දිවුල් | 85 |
| මිදි | 60 |
| ගස්ලබු | 70 |

(5) පහත චිත්‍ර ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| | |
|---|---|
| සදුදා | ○○○○○○○○○○ |
| අඟහරුවාදා | ○○○○○○○○ |
| බදාදා | ○○○○ |
| බ්‍රහස්පතින්දා | ○○○○○○○ |
| සිකුරාදා | ○○○○○○○○ |

○ = ජෑම් බෝතල් 100 ක් නිරූපිතයි.

1) සඳුදා දින නිපදවන බෝතල් ගණන කීය ද?

2) අඩුම බෝතල් නිපද වූ දවස කවදාද?

3) දින 5 තුළ නිපද වූ මුළු බෝතල් ගණන කීය ද?

*සැකසුම: නයනා අසෝකා මිය*

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA


# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය: 23-දත්ත අර්ථකථනය

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(1) පහත චිත්‍ර ප්‍රස්තාර මාතෘකා සඳහා එක් චිත්‍රයක් බැගින් අඳින්න.

වාහන – 

බීම බෝතල් –

නිවාස –

මගීන් –

පක්ෂීන් –

(2) පහත වගුවේ දත්ත චිත්‍ර ප්‍රස්තාරයකින් නිරූපණය කරන්න.

| කෑම වර්ගය | සිසුන් ගණන |
|---|---|
| පාන් | 5 |
| ඉඳි ආප්ප | 7 |
| තෝසේ | 6 |
| බත් | 4 |
| ආප්ප | 3 |

(3) එක්තරා සතියක් තුළ වෙළඳ සැලක දෛනික ආදායම පහත වගුවේ දැක්වේ.

| | |
|---|---|
| සඳුදා | රු. 1 500 |
| අඟහරුවාදා | රු. 3 000 |
| බදාදා | රු. 2 750 |
| බ්‍රහස්පතින්දා | රු. 1 500 |
| සිකුරාදා | රු. 2 250 |

එම තොරතුරු  = රු. 500 වන සේ ඉහත වගුවේ තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක ඇඳ දක්වන්න..
එම චිත්‍ර ප්‍රස්තාරය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i) බදාදා දින ආදායම දැක්වීමට ඇඳිය යුතු රූප ගණන කීයද? එය ඇඳ පෙන්වන්න.

(4) පාරක ගමන් කල වාහන පිළිබඳව එක්තරා කාල සීමාවකදී කරන ලද පරීක්ෂණ දත්ත පහත දැක්වේ.




කාර් – 7 බස් රථ – 9 වෑන් රථ – 13

ලොරි – 4 වෙනත් රථ – 6


ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න.
(මෙහිදී එක් වාහනයක් නිරූපණයට පහසු සංකේතයක් යොදා ගන්න.)

☐ – රථ 4 ක් දැක්වෙන ආකාරයට නිරූපණය කරන්න.

(5)

| | |
|---|---|
| ජනවාරි |  |
| පෙබරවාරි |  |
| මාර්තු |  |
| අප්‍රියෙල් |  |
| මැයි |  |

වසරේ මුල් පහ මාසය තුල නිපදවන ලද බීම බෝතල් ගණන ඉහත ප්‍රස්තාරයේ දැක්වේ. ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

 – 1000 ක් පෙන්වයි නම්,

i) මාර්තු මාසයේ නිපද වූ බෝතල් ගණන කීයද?

ii)  – පෙන්වන ගණන කීයද?

iii) වැඩිම නිෂ්පාදිත මාසය කුමක් ද?

iv) මුළු නිෂ්පාදනය කොපමණ ද?

v) පෙබරවාරි මාසයට වඩා මැයි මාසය තුල නිෂ්පාදනය කොපමණ වැඩි ද?

*සැකසුම: නයනා අසෝකා මිය*

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 24-දර්ශක |
|---|---|---|

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.

01. පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාදය \ බලය | ( )$^1$ | ( )$^2$ | ( )$^3$ | ( )$^4$ | ( )$^5$ | ( )$^6$ | ( )$^7$ | ( )$^8$ |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |
| 6 | | | | | | | | |
| 7 | | | | | | | | |
| 8 | | | | | | | | |
| 9 | | | | | | | | |
| 10 | | | | | | | | |

02.
1. 4 හි තුන්වන ගුණය කීයද? ............................
2. 4 හි තුන්වැනි බලය කීයද? ............................
3. 4 හි තුන්වැනි බලය හා ගුණය අතර වෙනස කීයද? ..................

$2^{\square} = 4^{\square}$

හිස්කොටුවලට ගැළපෙන සංඛ්‍යා දෙක ලියන්න.

03.
1. 12 හි තුන්වන ගුණය කීයද? ............................
2. 12 හි තුන්වන බලය කීයද? ............................

04. හිස්තැන්වලට ගැළපෙන සංඛ්‍යා සොයන්න.

1. (.......$^3$) + (.......$^3$) = 35
2. (.......$^2$) + (.......$^2$) = 41

72 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස දක්වා දර්ශක ආකාරයෙන් ලියා දක්වන්න.

..............................................................................................................................

$2^4 \times 5^2$ හි අගය සොයන්න. ...............................................

-


NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

| **6** ශ්‍රේණිය | ගණිතය | **ඒකකය** : 25 - වර්ගඵලය |
|---|---|---|


**01.** රූපයේ වර්ගඵලය සොයන්න.




..........................................

**02.** සමචතුරස්‍රයක දිග $6cm$ කි. සමචතුරස්‍රයේ වර්ගඵලය කීයද? ..............................

**03.** සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න.




..........................................

**04.** සෘජුකෝණාස්‍රාකාර ක්‍රීඩා පිටියක දිග $250m$ වන අතර පළල $150m$ කි. ක්‍රීඩා පිටියේ වර්ගඵලය කොපමණද?

..................................................

**05.** දිග $12cm$ වූ සෘජුකෝණාස්‍රයක වර්ගඵලය $60cm^2$ කි. එහි පළල සොයන්න.

..................................................